# Living the LOTUS

Buddhism in Everyday Life

7
2017
VOL. 142

FOUNDER'S ESSAY

## තමාව දැවාලීම

'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ එක් ගාථාවක් හෝ එක් පද පෙළක් ශ්‍රවණය කර ප්‍රිතිමත් වන්නට මොහොතක් යොදවන්නේද, ඒ තැනැත්තා අනුත්තර සම්‍යක් සම්බෝධිය සාක්ෂාත් කරන බව අවධාරණය කරමි' ලෙස 'ධර්මාචාර්යවරයෙකු' නම් පරිච්ඡේදයේදී බුදුන් වහන්සේ අවධාරණය කරයි.

ශ්‍රද්ධාව යනු පුදුම සහගත දෙයක් බැවින් ධර්මය එතරම් නොදැන සිටියද, තමා දන්නාවු ධර්ම කරුණු 'විශිෂ්ඨයි, විශිෂ්ඨයි' ලෙස ධර්මයේ සතුට අත්විඳින්නාවු අයට එකින් එක ආනිශංස ලබා ගැනීමට හැකිවේ.

නමුදු, අරකයි මේකයි ලෙස ධර්ම න්‍යායන් පටලවාගෙන, මුල සිටම අග දක්වා කට පාඩමින් කියුවද ආනිශංස ලබා ගැනීමට අපහසු වේ. එයට හේතුව නම්, ධර්ම න්‍යයන් තුල සිරවී සිටින්නාවු අය, ධර්මයෙන් ලබන්නාවු සතුටක් නොමැති නිසාය. එබැවින් ලබන්නාවු ප්‍රථිපලයද වෙනස් වේ.

එක් පද පෙළක් හෝ සතුටෙන් භාර ගන්නා වු පුද්ගලයන්, තමාව දැවාලමින් එම ධර්ම කරුණු ප්‍රායෝගිකව පුහුණුව සිදු කරයි. එසේ කරන්නාවු අයට තමා අවට සිටින්නාවු පිරිසද ධර්මයෙන් දැවාලීමට හැකිවේ. එබැවින් තමා අවට ආනිශංස වලින් පිරී ධර්මයේ විශිෂ්ඨත්වයට එහා දෙයක් නොමැතිවේ.

අවංක හදවතින් සැනෙකින් ධර්මයේ සතුට අත් විඳිමින් ප්‍රායෝගිකව කටයුතු කරනවාද නොමැතිනම්, තර්ක විතර්ක තුල ධර්ම න්‍යායන් පමණක් කථා කරනවාද යන්න තුලින් අප ජිවිත වල විශාල වෙනසක් අත් විඳීමට හැකිවේ.

නිර්මාතෘ සංකල්පනා 9 පි. 56-57

Living the Lotus
Vol. 142 (July 2017)

Rissho Kosei-kai International
Fumon Media Center, 2-7-1 wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international
@kosei-kai.or.jp

**Senior Editor:** Shoko Mizutani
**Copy Editor:** P.A.D. Somapala, G.N. Ruklanthi
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන , සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

# PRESIDENT'S GUIDANCE

## අන්‍යයන්ව පිළිගැනීම හා ප්‍රසංශා කිරීම

නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා



### 'ජීවිතයට' පැසසුම් කිරීම

මනුෂ්‍යයින්ගේ විශිෂ්ඨත්වය වර්ණනා කිරීම 'ප්‍රසංශා කිරීම' ලෙස සාමාන්‍යයෙන් හදුන්වයි. එසේ නම්, එම 'විශිෂ්ඨත්වය' මැනීම සඳහා පාදක කර ගන්නේ කුමන සම්මතයන්ද?

අපි සාමාන්‍යයෙන් විභාග ප්‍රතිපල, රැකියාවේ කාර්යක්ෂමතාව, ගති ගුණ, ක්‍රීඩාවට දක්ෂ බව ආදිය පාදක කරගෙන 'විශිෂ්ටයි' ලෙස පවසා ඔවුන්ව පිළිගෙන, ප්‍රසංශා කරයි.

නමුදු, බුදුන් වහන්සේ තම ජිවිතයට හානි පැමිණවීමට උත්සහ කළ දේවදත්ත කල්‍යාණ මිත්‍රයා ලෙස අගය කළහ. අතිශ්‍ය බිහිසුණු ඝාතකයෙකු වූ අංගුලිමාල තුල ශික්ෂණයක් ඇති කරමින් තම ශ්‍රාවකයෙකු බවට පත් කර ගත්හ.

එම දැක්ම ලෝකයේ පොදු හැගීමට වඩා වෙනස් වූවකි. මෙහිදී මනුෂ්‍යයින්ව පිළිගෙන, ප්‍රසංශා කරන අයුරු පිළිබඳව ඉතා වටිනා මතවාදයක් පෙන්වා දී ඇත.

සාමාන්‍ය භාවිතයේදී, 'පැසසුම' යනු 'අගය කර ප්‍රසංශා කිරීමයි' ලෙස අර්ථගැන්වේ. එසේ ගත් කළ තමාව ඝාතනය කළ පුද්ගලයෙකුව ප්‍රසංශා කිරීම කිසිසේත්ම කළ නොහැකිය. නමුදු බුදු දහමේ දේශනා කරන 'පැසසුම' නම් 'අප සතු බුදු ගුණයේ හා බෝධිසත්ව ගුණයේ පිං බලයට ගෞරව කිරීමය' ලෙස කියාදේ. ඒ අනුව ගත් කළ කොපමණ පව් කළ තැනැත්තෙකුව වුවද වර්ණනා කිරීමට බුදුන් වහන්සේ අමතක නොකලේ.. ඔවුන්ගේ බුදු ගුණයේ හා බෝධිසත්ව ගුණයේ පිං බලය පමණක් දුටු නිසාය.

මනුෂ්‍යයින්ව ඇගයීම් කර විනිශ්චය කිරීමේදී, එම පුද්ගලයන්ගේ ක්‍රියාවන්, වදන් හා ගතිගුණ නොසලකා හැරීමට නොහැකිය. නමුදු එයට පමණක් සීමා වූ විට මුලින්ම ප්‍රසංශාවට ගත යුතු වැදගත්ම කරුණ වන 'බුද්ධ ශක්තිය' අමතක වීමට තිබෙන ඉඩ වැඩිය. බුදු දහම ඉගෙන ගන්නා අපට වැදගත්ම දේ නම්, මනුෂ්‍යයන්ව පිළිගෙන, ප්‍රසංශා කිරීම යනු අන්‍යයන්ගේ 'ජිවිත' වලට පැසසුම් කිරීම නොවේද?

නමුදු සැබෑවටම එලෙස කිරීම අපහසුය. නමුත්, උදහරණයක් ලෙස දෙමව්පියන් ලෙස දරුවන් සමඟ කටයුතු කරන විට, ප්‍රධානීන් තම යටතේ සිටින සේවකයන් සමඟ කටයුතු කරන විට, තවද යහළුවන් සමඟ කටයුතු කරන විට ඒ එකිනෙකාගේ විශිෂ්ඨත්වය දකින්නට උත්සහ කරන්න. එසේම අපි එකිනෙකා ජිවිත බුදු ගුණයේ හා බෝධිසත්ව ගුණයේ පිං බලයෙන් යුතු 'ජිවිත' බවද අමතක නොකල යුතුය.

# PRESIDENT'S GUIDANCE

## ප්‍රවීනත්වය හා චතුර බව අවශ්‍ය නොවේ

වර්ණනා කිරීම හා ප්‍රසංශා කිරීම ලෙස පවසන විට, විශේෂයෙන්ම මෑත යුගයේ පිරිස් කළමණාකරණය හා දරුවන් හදවඩා ගැනීමේ ශිල්ප ක්‍රමයක් ලෙස 'වර්ණනා කිරීම' යන වදනේ පරිශීලනය ඉතා ඉහල ගොස් ඇත. එදෝ යුගයේ වාසය කළ ජිවුන් තෙරුණ් වහන්සේගේ ප්‍රසිද්ධ කියමනක් උපුටා දක්වමි.'කර පෙන්වා ආදර්ශමත් වන්න, කියා දී අවවාද දෙන්න, කරන්නට ඉඩහසර දෙන්න, උත්සහයට ප්‍රසංශා කරන්න, එයින් මිනිසුන්ට හැකියාව ලැබේවි' මෙම වදන හොඳින් කියවා බලන විට පැහැදිලි වන්නේ උගන්වන අයගේත්, ඉගෙන ගන්නා අයගෙත් දියුණුව එක්වර ඇතිවන බවයි.

අන්‍යයන්ව වර්ණනා කිරීම යනු, තම හදවත විවර කිරීමයි. වර්ණනා කිරීම ඉතාම වැදගත් යැයි පැවසුවද, හිතුවක්කාර පුද්ගලයන්ගේ මුවින් ප්‍රසංශාත්මක වදන් පිට නොවේ. අවංකව, අන්‍යයන්ව පිළිගනිමින්, ප්‍රසංශා කිරීම තුලින් මනුෂ්‍යයන්ගේ හදවත විවර කිරීමටත්,සුහදශිලී හැගීම ගොඩනැගීමටත් පාදක වේ. එබැවින් මනුෂ්‍යයින්ව පිළිගෙන ප්‍රසංශා කිරීම එම පුද්ගලයා වෙනුවෙන් පමණක් නොව, තමාව ඔපදමා ගැනීමේ පුහුණුවක් ලෙසද පැවසිය හැකිය.

1965 වසරේ මම උපවාස පුහුණුවේ යෙදුනු කාලයේ වු සිදුවීමකි මේ. දින 8 ක් පැවති උපවාස පුහුණුව අවසන් කර නිවසට පැමිණ ස්නානය කරමින් සිටිනා විට, මාගේ පියා වන නිර්මාතෘ තුමා එක්වරම නාන කාමරයට ඇතුළු විය. තවද, 'පිට අතුල්ලන්නම්' යැයි පවසා නිරාහාරව සිට වැහැරුණ මගේ පිට අතුල්ලමින් 'පිට දිස්නය දෙනවා නේ'ලෙස ප්‍රසංශාත්මකයියැයි කිව නොහැකි මෙම වදන පිට කළේය.

මේ සිදුවීම මා ලද දුර්ලභ අවස්ථාවකි. ඒ තුලින් අන්‍යයන්ව පිළිගෙන, ප්‍රසංශා කිරීමේදී වැදගත් වන්නේ කුමක්දැයි ටිකක් අවබෝධ වූවා යැයි සිතමි.

එනම් කෙනෙකුව වර්ණනා කිරීමේදී අවශ්‍ය වන්නේ ප්‍රවීනත්වය හා චතුර බව නොවේ, තමාගේ හා අන්‍යයන්ගේ ජිවිතයට ගෞරව කිරීම හා අන්‍යයන්ගේ දියුණුව හදවතින්ම ප්‍රාර්ථනා කිරීම යැයි සිතමි.

From *Kosei*, July 2017



# මා තුල වැඩසිටින බුදුන් වහන්සේ

රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනම
මාලි අල්විස්

*මෙම සෙප්පෝව 2016 නොවැම්බර් මස 01 වන දින ජපානයේ, දයිසෙයිදෝවේ පැවැත්වුවකි.*

සියලු දෙනාගෙන් අවසරයි, මගේ නම මාලිනි අල්විස්. ඉන්දියාවේ දකුණතින් පිහිටි දුපතක් වන ශ්‍රී ලංකාවේ සිට පැමිණියෙමි.

මා විවාහ වි දැනට වසර 31 කි. මගේ මහත්තයා පවුලේ අය හට හදවතින්ම ආදරය කරන කලබලකාරි නොවන, ඉතා උනන්දුවෙන් රැකියාව කරන විශිෂ්ට පුද්ගලයෙකි.

මගේ පුතාගේ වයස අවුරුදු 29 කි. සියලු දෙනාගේ ආශිර්වාදයෙන් මේ වසරේ විවාහ පත්විය. මගේ දුවගේ වයස අවුරුදු 27 කි. අපේ පවුලේ මහත්තයා, පුතා, ලේලිය හා දියණිය සමග සාමාජිකයන් පස්දෙනෙක් සිටි.

මම මේ වන විට රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ අධ්‍යක්ෂිකාවක් වශයෙන්ද, හෝසා කණ්ඩායම් නායිකාවක් හා පවුල් අධ්‍යාපන නායිකාව ලෙසද කටයුතු කරමි.

2010 වර්ෂයේ සිට යොෂිහිසා යමමොතො මහතා ශාඛා ප්‍රධානී ලෙස ශ්‍රී ලංකාවට පැමිණියේය.

ක්යොකයිචෝ සාන් සැම විටම අපට පැවසුවේ ‘හදවත හා මනස සංවර්ධනය’ කරමු, ‘ බුදුන් වහන්සේ ඒකාන්තයි’ ‘අපි එකිනෙකා, සියලුමදෙනා තුල වැඩසිටින්නාවු බුදුන්වහන්සේට ගෞරව කරමු’ ලෙස නිචිකෝ සෙන්සේයි වසර 20 ක් තේමාව කොට ගෙන දේශානා කරණ ලද එම කරුණුය.

ශ්‍රී ලංකාවේ සැදැහැවත් තේරවාදී බෞද්ධ දෙමාපියන්ගෙන් ඉපිද සැදීවැඩුනු මට, මා තුල බුද්ධ ශක්තිය ගැබ් වී ඇති බව එකවර විශ්වාස කල නොහැකි කරුණක් විය. එහෙත්, මේ වනවිට කෙමෙන් කෙමෙන් එම කරුණ විශ්වාස කර ප්‍රායෝගිකව කටයුතු කිරීමේ හැකියාව ලැබී ඇත.



*දයිසෙයිදෝවේදී සෙප්පෝව පවත්වන මාලි මිය.*

මා රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමට සම්බන්ධ වූයේ වර්ෂ 1996 දිය. මහත්තයාගේ මිතුරෙකු වන ගාමිනි චන්ද්‍රසේකර මහතා, ජපාන සංවිධානයක් තිබෙන නිසා එක් වරක් හෝ පැමිණ බලන්න යැයි ආරාධනා කලේය.

භික්ෂුන් වහන්සේලා නොමැති ගිහි සංවිධානයක් බව දැන සිටි නමුත් මහත්තයාගේ යහළුවා නිසා අකමැත්ත ප්‍රකාශ කිරිමට අපහසු විය.

අකමැත්තෙන් වුවද එහි ගිය මට උණුසුම් හැගීමෙන් යුතු යහලුවන් හමුවු අතරම, එකිනෙකා හට ගෞරව කරන්නාවු පිරිස පිළිබද ආශාවක් ඇති විය. එසේම දෙමාපියන්ට, මුතුන්මිත්තන්ට හා අන්‍යන්ට කෘතවේදිව කටයුතු කරන ආකාරය පිළිබදව චිත්තාකර්ෂණ හැගීමක් ඇතිවිය. ඉන්පසු සෑම පොහොය දිනයකදීම ධම්ම පදනමේ පවත්වනු ලබන ආගමික වැඩසටහන් වලට සම්බන්ධවි කටයුතු කිරිමට මා ද පෙලඹුනි.

මීට වසර කිහිපයකට ඉහතදී දකුණු ආසියානු ධර්ම ව්‍යාප්ත ප්‍ර ධානී තෙරුඹ සයිතෝ මහතාගේ මෛත්‍රී කරුණාව පරිදි ශ්‍රී ලංකාවට ටෝකියෝ පවුල් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනයේ දේශකවරු පැමිණ සම්මන්ත්‍රණ පැවැත්විම ආරම්භ විය.

එම පැවති පවුල් අධ්‍යාපන වැඩසටහන් වලදි මේ වනතුරු මම, දරුවන්ව මාගේ සිතැගි පරිදි හදවඩා ගැනිමට උත්සහ ගත් බව වැටහි මා පිළිබද පසුවිපරම් කර බැලීමේ හැකියාවක් ලැබුනි.

පවුල් අධ්‍යාපන යනු, තම දරුවන් තුල වැඩසිටින්නාවු බුදුන්වහන්සේට ගෞරව කිරිම ලෙස ඉගැන්වේ. සද්ධර්මපුණ්ඩරික සුත්‍රයේද කියාදීම් එයම බව වැටහිනි.

තවද පවුල් අධ්‍යාපනය සද්ධර්මපුණ්ඩරික සුත්‍රයේ කියාදිම් සමාජගත කිරිමට තවත් එක් මාර්ගයක් ලෙස වැටහිනි.

මේ වන විට ශ්‍රී ලංකාව පුරා දෙමාපියන්ව අපගේ පවුල් අධ්‍යාපන වැඩසටහන් වලට සම්බන්ධ කරගනිමින් කැපවීමෙන් කටයුතු කරමින් සිටිමි.

මේ සියල්ල අතරේ වර්ෂ 2015 වේ සිට ධම්ම පදනමේ

හිඳී තම පවුල මුල්කොට ගෙන හෝසා කණ්ඩායම් ආරම්භ කරන ලදි. බුද්ධරූපය ලබාගෙන ඇති ඕනෑම සාමාජිකයෙකුට ස්වකැමැත්තෙන් හෝසා කණ්ඩායම් නායකයන් ලෙස වගකීම බාරගන්නා බවට දිවුරුම් දිය හැකිය.

එහි තේමාව නම්, තම නිවසේ හා නෑදෑ හිතමිතුරන්ගේ නිවසේ, දන්නාහඳුනන අය කැඳවා අප සංවිධානයේ ධර්ම කරුණු කාරණා ඉගෙන ගන්නා හෝසා වට පවත්වා, පවුලේ එකිනෙකා තුල වැඩසිටින්නාවූ බුදුන්වහන්සේට ගෞරව කිරීමයි.

මමද හෝසා කණ්ඩායම් නායිකාවක් ලෙස වගකීම් දරණ බවට දිවුරුම් දුන්නෙමි. නෑදෑ හිතමිතුරන්, අවට පිරිස, යහලුවන්, දන්නා හඳුනන අය නෙදොරි කරමින් සිටින අතර තුර, අවුරුදු 30 ක් පමණ කාලයක් පුරාවට හඳුනන එක් කාන්තාවක් සිටියහ.

ඇය, ස්වාමි පුරුෂයා, පුතුන් තිදෙනෙකු සමග ඉතා සතුටින් කාලය ගත කලේය. එසේ කාලය ගතකරමින් සිටින අතරතුර හිටිහැටියේ ඇයගේ ස්වාමිපුරුෂයා හදිසි රිය අනතුරකින් ජිවිතක්ෂයට පත්විය. පසුව, ඉන් වැඩිකලක් නොගොස් මාස 5 කට පසු රෝගාතුරව සිටි තම පියා ද ජිවිතක්ෂයට පත්විය.

ඇය පවුලේ සිටි එකම දරුවා විය. ඇයට ඉතිරි වූයේ වයස අවුරුදු 15 ක, 9 ක හා අවුරුද්දක පුතුන් තිදෙනෙකු සමග රෝගාතුරව සිටි තම මෑණියන් පමණි. ගෘහනියක් ලෙස කටයුතු කල ඇයට එදිනෙද ජිවත්වීමට අවශ්‍ය කටයුතු කරගැනිම සඳහා කිසිදු මාර්ගයක් නොතිබුනි.

එසේම, මීළඟට තම වැඩිමල් පුතුගේ ජීවිතය පවා බිලිගනී යැයි දැඩි බියෙන් හා ජිවත්ව සිටින නිවසේ විපත් ගෙන දෙන යම් දෝශයක් ඇතැයිද සිතමින් සිත්තැවුලට පත්ව සිටියහ. රෝගාතුර ව් සිටින තම මෑණියන්ගේ සාත්තු කටයුතු කිරිමද ඇයට විශාල බරක්විය.

විට කලෙකින් ඇය ජිවත්ව සිටි නිවස කුලියට දී, වෙනත් නිවසක් කුලියට ගෙන පදිංචියට ගියේය. එසේ කිරිම නිසා නෑදැයින් විසින් 'තමන්ගේ අම්මාට හොඳින් සලකන්නේ නැහැනේ. ඇයි මේ තරම් කුඩා නිවසකට ආවේ', ආදිය වැරදි කියමින් දෝෂාරෝපනය කලේය. එයින් ඇගේ සිත තවත් කඩාවැටෙන්නට විය.

කිසිම කෙනෙකු සමග තම ප්‍රශ්න කතා කිරිමට නොහැකිව මා ලගට පැමිණ විශ්වාසයෙන් සියල්ල පැවසීය. 'මට පුළුවන් ආකාරයට අම්මට සලකනවා, එත් නෑදෑයන් කිසිම උදව්වක් නොකර ඉද හිට පැමිණ දෝෂාරෝපනය කරනවා' යනුවෙන් දිගින් දිගටම කොපයෙන් තමන්ගේ සිතිවිලි නොනවත්වා කතාකලේය.

පසුව, මම ඇය සමග එකතුව ක්යෝකයිචෝ සාන් ගෙන් උපදෙස් ලබාගැනිම සඳහා ගියේය.

ක්යෝකයිචෝ සාන් විසින් 'ඔබ අවංකවම අම්මට ආදරයෙන් සලකමින් කටයුතු කරනවානේ. ඒ අයුරින්ම ඉදිරියටත් තමාව මේ ලෝකයට බිහිකළ අම්මාට කෘතවේදීව කටයුතු කරන්න. දොස් පවරණ නෑදෑ හිතරමිතුරන්ටද හදවතින්ම කෘතවේදීවන්න' යැයි උපදෙස් ලබාදුන්නාහ.

තවද, ක්යෝකයිචෝ සාන් මා හට දුන් උපදෙස නම් 'කොතරම් දුක් වේදනාවන් තිබුනත් බුදුන් වහන්සේව විශ්වාස කරමු. ඇයගේ හදවත තුල වැඩ සිටින්නාවූ බුදුන් වහන්සේ දිප්තියෙන් බැබලෙනවා, යන හැඟීම සිතේහි අදිටන් කරගෙන බුදුන් වහන්සේව විශ්වාස කරමින් දිගටම ඇයත් සමග කටයුතු කරන්න' යනුවෙනි.

මා ක්යෝකයිචෝ සාන් විසින් දුන් උපදෙස විශ්වාස කරමින්, ඉක්මනින් ඇය තුල වැඩ සිටින්නාවූ බුදුන් වහන්සේට ගෞරව කිරිමේ පුහුණුව ආරම්භ කලේය. එසේ කරනවිට, ඇයද ක්යෝකයිචෝ සාන් කියාදුන් ආකාරයටම පුහුණුවීම් ආරම්භ කරන ලදි.

මා ද පුදුමයට පත්කරවමින් ක්යොකයිචෝ සාන්ට දැනුනු පරිදි මෑණියන්ව වැදගත් කොට සැලකිය යුතුයි, යන සිතිවිල්ල ඇගේ හදවතේ ඇති බුදුන්වහන්සේ ලෙස විද්‍යාමාන වන විශ්මිය බව දැනුනි. ඊට පසුව ඇගේ නිවසේ බුද්ධ රූපය තැන්පත් කළ අතර ඇය, උදෑසන හා සවස සූත්‍ර සජ්ඣායනා කිරිමට ද පෙළඹුනි.

ඇයගේ නිවස විකුණා ගැනීමට අවශ්‍ය වුවද, ක්‍රමයෙන් මිනිසුන් මිය යන නිවසක් යැයි ප්‍රචාරය වීම නිසා ගැණුම්කරුවන් පැමිණියේ නැත. නමුදු, අදහාගත නොහැකි ලෙස සූත්‍ර සජ්ඣායනා කිරිමේ පිහිටෙන් නිවස විකුණා ගත හැකිවිය. නිවස විකිණිමට හැකිවිම ඇගේ අඳුරු ජිවිතයට ආලෝක කදම්බයක් පතිත වුවා විය. ඇය හා පවුලේ සැමට එදිනෙද ජීවිතයේ කටයුතු ගැටලුවකින් තොරව කරගෙන යාමට ආදයම් මාර්ගයක් එයින් ලැබුනි.

ඊට පසු වයස අවුරුදු 17 වූ දෙවැනි පුතා හට වැඩිදුර අධ්‍යාපනය සඳහා චිනයට යාමේ අවස්ථාව හිමිවිය. දෙවන පුතාව චිනයට පිටත් කර යවමින් කාලයක් රෝගාතුරව සිටි ඇයගේ මෑණියන් ද මෙලොව හැර යන්නට ගියාය.

ඇයට උදව් කරමින් හා බාල සොහොයුරා රැක බලාගෙන අඩු වැටුපකට රැකියාව කල වැඩිමල් පුතනුවන්දට චීනයේ පාසලකට යාමට අවස්ථාව උදාවිය. ඔහුට වියදම් කටයුතු වශයෙන් ශිෂ්‍යත්ව අරමුදල් ද ලැබී ඇත.

ඇයට දරුවන්ගේ විදේශ අධ්‍යාපනය සඳහා අවශ්‍ය මුදල් යැවීමට අපහසු නිසා එදිනෙද වියදම් වලට අවශ්‍ය මුදල් උපයාගැනිමට පුතුන් දෙදෙනා අර්ධකාලින රැකියා වන් වල නිරතවෙමින් සිටි. වසර ගණනාවකට පසුව නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන විට සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව, චින භාෂාව, කතාකල හැකි පුද්ගලයන් වශයෙන් ඔවුනට ජිවන වෘත්තිය

# Spiritual Journey

කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ක්යෝකයිචෝ සාන් හැමවිටම කියාදෙන පරිදි, 'බුදුන් වහන්සේව විශ්වාස කිරීම හා තමා තුල වැඩ සිටින බුදුන්ට ගෞරව කර කටයුතු කිරීම' තුලින් දුකින් මිදීමට හැකිවන බව ඇයගෙන් තහවුරු කර ගැනීමට හැකි විය.

මා රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමට සම්බන්ධ වී දැනට වසර 20 ක් වේ. මෙම නොවැම්බර් මස (2016) මේ දයිසේදොවේදි සෙප්පොවක් කිරීමේ වගකීම පැවරී ඇති බව ක්යොකයිචෝ සාන් ගෙන් දැනගත් අවස්ථාවේ වචනයෙන් පිටකල නොහැකි ඉමහත් සතුටක් ඇතිවිය.

එහිදි, නිර්මාතෘ තුමා හා නිච්කෝ සෙන්සෙයි විසින් කරන්නවු ධර්මය දේශනාවන්ට හා ජපාන සාමාජිකයින්ගෙන් නිතරම ලැබෙන කරුණාවට හදවතින්ම ස්තුතිය පුදකල හැකියැයි සිතුවාය.

එසේ වුවත් (2016) අගෝස්තු මස 23 වන දින මා හදිසි රිය අනතුරකට ලක් විය. ඒ මාගේ පුතා විසින් ධාවනය කල මොටර් රථය රාත්‍රි 7.30 ට පමණ අධිවේගී මාර්ගයේ වැටෙහි ගැටී පිටතට පෙරළී, උඩුයටිකුරු වීමෙනි. එයින් මගේ කොඳු ඇට පෙලෙහි හා පාදයන් හි අස්ථි බිඳී දැඩි ලෙස තුවාල විය.

ගාල්ලේ පැවති මාගේ පියාගේ ගුණානුස්මරන පිංකම වෙනුවන් නෑදෑ හිතමිතුරන් සමග එකතුවී පිළිකා රෝගීන් 318 දෙනෙක් හට රාත්‍රි ආහාර සකසා පරිත්‍යාග කර නැවත පැමිණෙමින් සිටින අතරතුරයි මේ අනතුර සිදුවුවේ.

රිය පදවමින් සිටි පුතා වෙහෙසට පත්ව සිටි අතර ඇස් පියවී රථය අනතුරට ලක් වී ඇත. නමුත්, රියපදවමින් සිටි පුතාට හා ඉදිරිපස අසුනේ සිටි ලේලියට කිසිදු තුවාල නොතිබුනි.

අධිවේගි මාර්ග පොලීසිය විසින් 'මේ ස්ථානයේ වු රිය අනතුරකින් ජීවිතහානි නොවු ප්‍රථම අවස්ථාව මෙයයි' ලෙස මාගේ මහත්තයා සමඟ පවසා ඇත. ඇත්තටම, 'මාගේ ජිවිතය බුදුන් වහන්සේ විසින් ආරක්ෂා කරදුනි' යැයි මම විශ්වාස කරමි.

තවද, මා පුදුමයට පත්වුවේ.. මගේ නෑදෑ හිතමිතුරන් විසින් 'මාලි දිනපතා රිෂ්ෂෝ කොසෙයි ධම්ම පදනමේ කටයුතු කැපවීමෙන් කරන නිසා, ජිවිත හානියකින් තොරව බේරුනා නේදැයි' පැවසුවිටය.

එහෙත්, මාගේ පුතා 'මේ තරම් කැපවිමෙන් කටයුතු කරන අම්මාට පමණක් තුවාල සිදුවුනේ මන්ද' යැයි මැසිවිලි නැගුහ. හදිසියේවත්, 'මේ අනතුරෙන් පුතාට හෝ ලේලියගේ ජීවිතයට කරදරයක් වුවානම්, මට ජිවත්වී එලක් නැත. ඒ බව, බුදුන් වහන්සේ හොදින් දන්නා නිසා මා හට පමණක් තුවාල ඇති කරන්නට කාරුණික වුවා යැයි සිතමි'. ඒ වෙනුවෙන් මා හදවතින්ම බුදුන් වහන්සේට ස්තුති වන්ත වෙමි.

රෝහලේ ඇද මත සිට මෙම සෙප්පෝව කරනවාද, නැද්ද යන්න කල්පනා කලේය. එවිට, 'ශ්‍රී ලංකාව නියෝජන කරමින්, බුදුන් වහන්සේගෙන් ලද වගකීම කුමණ ගැටලු පැමිණියත් භාරගෙන කටයුතු කරමි', යැයි හදවතින්ම තීරණ කර, ජපානය බලා යාමට අධිෂ්ඨාන කලෙමි.

ලබන වසරේ ශ්‍රී ලංකා ශාඛාවේ නව ගොඩනැගිල්ලට බුදුපිලිම වහන්සේ තැන්පත් කිරීම සිදුකරණු ලබයි. නව ගොඩනැගිල්ල අප ශ්‍රී ලාංකික රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ සාමාජිකයන්ට මුදුන් මල්කඩ බදු පූජනීය ස්ථානය වේ. සදතනික බුදුන් වහන්සේගේ පිළිමය වඩමවා තැන්පත් කරන තෙක් අප නොයිවසිල්ලෙන් උතුරායන සතුටින් මගබලා සිටිමු.

දැන් මේ කථාකරන්නාවු මාගේ ජිවිතය රිය අනතුරින් නැතිවෙන්නටද ඉඩ තිබුණි. නමුදු අද මා මේ ලබාසිටින්නේ බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් ලත් ජිවිතයයි. එබැවින්, නිච්කෝ සෙන්සෙයි දේශනා කරන පරිදි, 'බුදුන් වහන්සේ ඒකාන්තයි, ධර්මය ඒකාන්තයි' යන එකී ධර්මය විශ්වාස කර, මේ ලැබුනු ජීවිතය ප්‍රයෝජනයට ගනිමින් කොපමණ බාධක පැමිණියත් සද්ධර්ම පුණ්ඩරික සුත්‍රය ව්‍යාප්ත කිරීම වෙනුවෙන් ජීවිතය කැපකරමින්, අධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට ප්‍රතිඥදෙමින් මාගේ සෙප්පොව අවසන් කරමි .

සියලුදෙනාටම බොහොම ස්තුතියි.



*මාලි මිය හා නදීපා මිය පවුල් අධ්‍යාපන වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කරමින්*

# Living the LOTUS



# Childcare lifeline

## 8 වසරේ ඉගෙන ගන්නා දුව ඉතාම හිතුවක්කාරය. ඇය සමඟ කටයුතු කළ යුත්තේ කෙසේද?

**Q** **8 වසරේ ඉගෙන ගන්නා දුව දෙමව්පියන්ට හිතුවක්කාර වෙන්නට පටන් ගත්තා. ජංගම දුරකථනයක්ද කුලියට ලබාගෙන, නිතරම කෙටි පණිවුඩ යවයි. රෑබෝවී ගෙදරට එයි. භාවිතයට දෙන සුළු මුදලට වඩා වැඩියෙන් භාණ්ඩ මිලදී ගන්නවා සේ හැගෙයි. කාමරයත් හොදටම හැඩි වී තිබෙන විට, ඒ ගැන කියුවත් 'මල වදයක්' කියා ඇහුම්කන් නොදෙයි. තදින් අවවාද දුන් විට හිතුවක්කාර වේ. ඇය සමඟ කටයුතු කළ යුතු වන්නේ කෙසේද?**

**A** 8 වසරේ දරුවන් ටිකෙන් ටික ළඳරු අවධියෙන් දුරස්ව වැඩිහිටි වියට පා තබයි. එබැවින් තවමත් ළඳරුවෙක් ලෙස තමාට සලකනවාට අකමැතිවි, තම සිතුම් පැතුම් වලට අනුව කටයුතු කරයි. එමනිසා දෙමව්පියන්ගේ ආඥාවට, බාධක වලට, ආධිපත්‍යයට අවනත නොවී තදින්ම හිතුවක්කාර වේ. තදින් අවවාද කරන විට ඒ හා සමානවම හිතුවක්කාර ලෙස කටයුතු කරයි.

'තම ශක්තිය තුලින් ජීවත් විය යුතුය' ලෙස සිතීම වැඩිහිටියකු ලෙස කටයුතු කිරීමේ පලමු පියවර වේ. දරුවාගේ එම හැගීමට ගෞරව කර මව ඉතාමත් සන්සුන්ව, දියණියට රැකවරණය දිය යුතුය. ජංගම දුරකථනය භාවිතා කිරීම, ගෙදරට රෑ වී පැමිණීම, මුදල් පාලනය, කාමරය අස් කිරීම ආදිය මවට අවශ්‍ය ආකාරයට කිරීමට දරුවාට බලපෑම් කරනවා නොවේදැයි පසු විපරම් කර බලන්න. එලෙසම 'මොකෝ වුනේ, ඔයා මෙහෙම නැහැනේ, මොනවාහරි ප්‍රශ්නයක් තියෙනවාද' ලෙස දරුවාගේ හැගීමට හොඳින් සවන් දී, හැගීම් බෙදාගනිමින්, දරුවාගේ වැඩ, සැලැස්ම, සිතන ආකාරයට ගෞරව කර කටයුතු කිරීම වැදගත් යැයි සිතමි.

එය 'දරුවාට අවනත වීමම' නොවේ. මුලින්ම දරුවාගේ හදවත හොඳින් ග්‍රහණය කර ගැනීම තුලින්, රෑ වීම හා මුදල් පාලනය ගැන මවගේ හැගීම පවසා එකිනෙකා තුල අවබෝධය ඇති කර ගැනීම වැදගත්ය. 'අවබෝධය' යනු එකම සිතුවිලි වලින්, එකම මඟක යාමයි' ලෙස අර්ථ ගැන්වේ. නමුදු එකිනෙකාගේ වෙනස්කම්ද පිළිගැනීම අවබෝධය වේ. එලෙස, මෙම අවධියේදී දරුවන්ගේ සිතුම් පැතුම් වල වෙනස පිළිගනිමින්, රැකවරණය ලබා දෙමින් සහයෝගයෙන් කටයුතු කළ යුතුය. එසේ තමතමන් ගැන අවබෝධය පුළුල් වූ විට එකිනෙකා ගැන සිත කටයුතු කිරීමට හැකිවේ.

'මල වදයක්' ලෙස පවසන්නේ, අනිවාර්යයෙන්ම කියවනවා වැඩිවී වදයක් නිසා යැයි සිතමි. කියවන ප්‍රමාණය අඩුකර දරුවාට ළංවීමට මව දරණ උත්සහය අනිවාර්යයෙන්ම දරුවාට සම්ප්‍රේෂණය වේවි.අම්මා නිතරම තමාව පිළිගනිමින්, විශ්වාස කර කටයුතු කරන බව අවබෝධ වූ විට, දරුවා තමාවත් අන්‍යයන්වත් වැදගත් ආකාරයට සලකන්නාවූ පුද්ගලයෙකු ලෙස දියුණු වේවි.



### Point

මෙම වයස් කාණ්ඩ වලදී තම පරමාදර්ශය මත ආත්ම අභිමානය ඉහල යයි. එම ආත්ම අභිමානය පිලිගත යුතුය යන හැගීම ඉතා තදින්ම පවතින කාලයයි. එබැවින් තම පැවත්ම පිළිගත යුතුය ලෙස සිතමින්, නොයෙක් ආකාරයන් තුලින් වැඩිහිටි අයට බලපෑම් කරයි. එය මේ අවධියේ තිබෙන කරදරකාරී හැසිරීම හා හිතුවක්කාරකමයි. එම හිතුවක්කාරකම දරුවන්ගේ වර්ධනයේ සලකුණක් ලෙස බාර ගනිමින් කටයුතු කිරීම වැදගත් යැයි සිතමි.

(පිළිතුරු: තෝකියෝ පවුල් අධ්‍යාපන හා පරියේෂණ ආයතනය)

තෝකියෝ පවුල් අධ්‍යාපන හා පරියේෂණ ආයතනය '' පළමුව දෙමව්පියන් වෙනස් වුවහොත් දරුවා වෙනස් කළ හැකියි'' යන මූලික සිද්ධාන්තය පෙරදැරි කරගෙන ලොව පුරා සම්මන්ත්‍රණ පවත්වමින් දෙමව්පියන් දැනුවත් කරයි. බොහෝදෙනා '' දරුවන් තුලින් හදරන පවුල් අධ්‍යාපනය'' යන තේමාව සිය පවුලට ආදේශ කර ගනිමින් සතුටෙන් පිරි ආලෝකමත් පවුල් සංස්ථාවක් බවට පත් කොට ගෙන ඇත.

# Buddhist Wisdom for Family Life

## දෙමව්පියන්ද ගෞරව කිරීම අමතක නොකළ යුතුය

දියණිය නව යොවුන්වියට පැමිණීමත් සමගම ශාරීරික හා මානසික අස්ථාවරත්වයට පත්ව තිබේ. නමුදු මෙය අවස්ථාවක් කරගෙන දියණියද පියවරෙන් පියවර දියුණුවී ශක්තිමත් වේ.

මේ අවස්ථාවේ දෙමව්පියන්ගේ රැකවරණය කෙසේ විය යුතුද?. යන්න නිච්කෝ නිවානෝ තුමා පහද දෙයි.

'දෙමව්පියන් ධර්මයට දෑස් විවර කර, නිතරම කෘතවේදීත්වයෙන් සිටියි නම් දරුවන් කොපමණ ආවේගශීලිව කටයුතු කළද සංසුන් මනසින් භාර ගැනීමට හැකිවේ. ගෞරව කිරීමද අමතක නොවේ. දෙමව්පියගේ එම ස්වරූපයට විශ්වාසය ඇතිවී හදවත විවර කර ඕනෑම ප්‍රශ්නයක් අවංකවම කථා කිරීමට දරුවන් පෙළඹෙයි.'

දරුවා 8 වසරේ නම්, අම්මාත් මවක් ලෙස 8 වසරේය. එබැවින් දියණියගේ අස්ථාවර හදවතට තුරුළු වී, බුදුන් වහන්සේගේ දයාදයක් වු දියණියගේ ජීවිතයට ගෞරව කර කටයුතු කිරීමෙන් මවක් ලෙස තමාව අධ්‍යනය කිරීමට උත්සහ ගනිමු.

(කතුවැකිය සැපයීම, රි. කෝ. කා. ධර්ම අධ්‍යාපන අංශය)

Living the Lotus

මාසික සඟරාවට ඔබගේ අදහස් හා යෝජනා සාදරයෙන් පිළිගන්නෙමු.

E-mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Director's Column

## තමා තුල හා අන්‍යයන් තුල වැඩසිටින බුදුන් වහන්සේට ගෞරව කිරීම

ජුනි මස 04 වන දින ශ්‍රී ලංකාවේ, රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනමේ නව බුදු පිළිම වහන්සේ නිරාවරණය කිරීමේ උත්සවය කොළඹට ආසන්න ස්ථානයක පැවැත්වුනි. ථේරවාද බුදු දහමින් පෝෂිත ශ්‍රී ලංකාව තුල සදතනික බුදුන් වහන්සේගේ පිළිමයක් තැන්පත් කර නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට හැකිවුවේ ශ්‍රී ලංකා ශාඛාවේ යමමොතෝ ශාඛා ප්‍රධානී තුමා ප්‍රමුඛ සාමාජික සාමාජිකාවන්ගේ ශ්‍රද්ධාව නිසාමය.

යමමොතෝ ශාඛා ප්‍රධානී තුමා 2010 වසරේ තම පත්වීම භාරගත් අවධියේ සිටම සාමාජිකයන්ට පැවසු දෙය නම්, තමා තුල වැඩසිටින බුදුන් වහන්සේට ගෞරව කර අන්‍යයන් තුල වැඩසිටින බුදුන් වහන්සේටද ගෞරව කරමු යන්නයි. නමුදු ථේරවාද බෞද්ධ සාමාජිකයන්ට බුදුන් වහන්සේ යනු ඉතා විශිෂ්ඨ කෙනෙකි, ඒ හා සමාන ශක්තියක් තමා තුල තිබෙන බව පැවසුවද මුලදී විශ්වාස නොකල බව පැවසේ. නමුත් අවුරුදු 8 ක කාලයක දේශනා හා ප්‍රායෝගික පුහුණුව නිසා වර්තමානයේ සාමාජිකයන් තමා තුල වැඩසිටින බුදුන් වහන්සේට ගෞරව කර අන්‍යයන් තුල වැඩසිටින බුදුන් වහන්සේටද කරමින් කටයුතු කරයි.

නව බුදු පිළිම වහන්සේ නිරාවරණය කිරීමේ උත්සවයේදී ශ්‍රී ලංකා සාමාජිකයන්ගේ නිර්මල වු බුද්ධ ශක්තියට ගෞරව කිරීමේ ස්වරූපයට හා ඉමහත්වු සතුට හා එක්වී මමද උද්වේගයට පත්විය.


රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
ශෝකෝ මුසුතනි මහතා





RISSHO KOSEI-KAI INTERNATIONAL BRANCHES

Rissho Kosei-kai

# Overseas Dharma Centers 2017

## Rissho Kosei-kai International
3F Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

### Rissho Kosei-kai International of North America (RKINA)
2707 East First Street Suite #1 Los Angeles
CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

### Branch under RKINA

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, USA
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel*: (727) 560-2927
*e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

### Rissho Kosei-kai Buddhist Church of Hawaii
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

### Rissho Kosei-kai Buddhist Center of Los Angeles
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**

**Rissho Kosei-kai Buddhist Center of Colorado**

**Rissho Kosei-kai Buddhist Center of San Diego**

**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**

**Rissho Kosei-kai Buddhist Center of Dallas**

### Rissho Kosei-kai of San Francisco
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**

**Rissho Kosei-kai of San Jose**

### Rissho Kosei-kai of New York
320 East 39th Street, New York, NY 10016, U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, U.S.A.
*Tel :* 1-773-842-5654
*e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/˜rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

### Rissho Kosei-kai Dharma Center of Oklahoma
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112, U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Buddhist Center of Klamath Falls**
1660 Portland St. Klamath Falls, OR 97601, U.S.A.

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204, U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419, U.S.A.
http://www.rkina-dayton.com/

### Risho Kossei-kai do Brasil
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060, Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000, Brasil
*Tel:* 55-11-5549-4446/55-11-5573-8377

### Rissho Kosei-kai of Taipei
4F, No. 10 Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Taichung**
No. 19, Lane 260, Dongying 15th St., East Dist.,
Taichung City 401, Taiwan
*Tel:* 886-4-2215-4832/886-4-2215-4937 *Fax:* 886-4-2215-0647

### Rissho Kosei-kai of Tainan
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Rissho Kosei-kai of Pingtung**

### Korean Rissho Kosei-kai
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

### Branches under the Headquarters

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960
*e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949
*e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**

**Rissho Kosei-kai of Venezia**
Castello-2229 30122-Venezia Ve Italy

**Rissho Kosei-kai of Paris**
86 AV Jean Jaures 93500 Tentin Paris, France

## International Buddhist Congregation (IBC)
3F Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

# Rissho Kosei-kai of South Asia Division
3F Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

## Rissho Kosei-kai International of South Asia (RKISA)
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

## Branches under the South Asia Division

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi,
110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka
New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar,
Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

## Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218 *e-mail:* info.thairissho@gmail.com

## Rissho Kosei-kai of Bangladesh
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station: Mirshari,
District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

## Rissho Kosei Dhamma Foundation, Sri Lanka
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax*: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

## Other Groups

**Rissho Kosei-kai Friends in Shanghai**